**කලාප අධ්‍යාපන කාර්යාලය - රත්නපුර**

**ව්‍යාපාර සංඛ්‍යානය - 12 ශ්‍රේණිය**

**ඒකක පරීක්ෂණ - 5.0 ව්‍යාපාරික අවදානමට මුහුණදීමේ සූදානම ප්‍රදර්ශනය කරයි.**

1. නිර්ණායන මූලික පරීක්ෂණ හා සසම්භාවී පරීක්ෂණ අතර වෙනස පැහැදිලි කරන්න.

- 1 සිට 6 තෙක් අංක යෙදූ සමබර දාදු කැටයක් හා සමබර කාසියක් එකවර උඩ දැමීමේ පරීක්ෂණයට අදාළ ව එක් එක් අවස්ථා සම්මත සංකේත ඇසුරෙන් ප්‍රකාශ කර වෙන් රූප සටහන් ඇඳ දක්වන්න.

  (i) කාසියේ සිරස ලැබීමේ සිද්ධිය - A

  (ii) දාදු කැටයේ 5 වැටීමේ සිද්ධිය - B

  (iii) කාසියේ සිරස වැටීම හෝ දාදුවේ 5 අංකය වැටීම

  (iv) කාසියේ සිරස හා දාදුවේ 5 අංකය ලැබීමේ සිද්ධිය

  (v) මෙම පරීක්ෂණයට අදාළ ව කාසියේ සිරස නො වැටීමේ සිද්ධිය

  (vi) කාසියේ සිරස හෝ දාදුවේ අංක 5 අගය නො ලැබීම

  (vii) කාසියේ සිරස ලැබීම සහ දාදුවේ අංක 5 ලැබීම යන සිද්ධි දෙක ම එක විට සිදු නොවීම

  (viii) කාසියේ සිරස වැටීම හා දාදුවේ අංක 5 නො ලැබීමේ සිද්ධිය

  (ix) දාදුවේ 5 වැටීම සහ කාසියේ සිරස නො වැටීමේ සිද්ධිය

2. සංකරණ හා සංයෝජන අතර වෙනස පැහැදිලි කරන්න.

(i) $B_1, B_2, B_3, B_4$ යන පිරිමි ළමුන් හතර දෙනෙක් ද $G_1, G_2, G_3$ යන ගැහැණු ළමුන් තුන් දෙනෙක් ද සිටින කණ්ඩායමකින් ළමයින් දෙදෙනෙකු තෝරා ගත හැකි ආකාර ගණන කීය ද?

(ii) දෙදෙනා ම පිරිමි ළමුන් වීමේ සම්භාවිතාව සොයන්න.

(iii) දෙදෙනා ම ගැහැණු ළමුන් වීමේ සම්භාවිතාව සොයන්න.

(iv) අඩු වශයෙන් එක් පිරිමි ළමයෙක්වත් තෝරා ගැනීමේ සම්භාවිතාව සොයන්න.

සමාගමක නිෂ්පාදන කළමනාකරුවන් පස් දෙනෙක් සහ අලෙවි කළමනාකරුවන් තිදෙනෙකු සේවය කරති. මොවුන්ගෙන් ඕනෑ ම කළමනාකරුවන් තුන් දෙනෙක් අධ්‍යක්ෂවරු ලෙස පත් කළ යුතු ව ඇත. එම අධ්‍යක්ෂ මණ්ඩලයට

1. නිෂ්පාදන කළමනාකරුවන් දෙදෙනෙකු පත්වීමේ
2. අලෙවි කළමනාකරුවන් දෙදෙනෙකු පත්වීමේ
3. අලෙවි කළමනාකරුවෙකු පත් නො වීමේ
4. යටත් පිරිසෙයින් නිෂ්පාදන කළමනාකරුවන් එක් අයෙකුවත් පත්වීමේ සම්භාවිතාව සොයන්න.